DCS ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
தொகைமதிப்பு மற்றும் புள்ளிவிபரத் திணைக்களம்
Department of Census and Statistics

TEL: 011-288 9516 FAX: 011-288 3655 E-mail: rgdeptvsu2011@gmail.com

# මධ්‍ය වාර්ෂික ජනගහනය:

වෙබ් නිකුතුව - 2023 ,සැප්තැම්බර්

උපත්, මරණ හා සංක්‍රමණය රටක ජනගහනය වෙනස් වීමට බලපාන ප්‍රධාන සාධක වේ. උපත්, මරණ හා සංක්‍රමණය අඛණ්ඩව සිදුවන ක්‍රියාවලියක් බැවින් රටක හෝ කිසියම් භූමි ප්‍රදේශයක ජනගහනය කාලය සමග නිරන්තරයෙන් වෙනස් වීමට ලක්වේ. සෑම රටක්ම ජන සංගණනයකදී කිසියම් මොහොතක සිටින ජනගහනය ගණනය කිරීම සිදු කරනු ලබයි. මේ අනුව ශ්‍රී ලංකාවේ අවසන් වරට ජන හා නිවාස සංගණනය 2012 වසරේදී පවත්වන ලද අතර 2024 වසරේදී මීලඟ සංගණනය පැවැත්වීමට සැලසුම් කර ඇත. අන්තර් සංගණන කාල පරාසය තුල රට තුල සිදුවන උපත්, මරණ හා සංක්‍රමණය පිළිබඳ පරිපාලනමය දත්ත පදනම් කරගෙන වාර්ෂිකව ජනගහනය ඇස්තමේන්තු කරනු ලබයි. මෙම ඇස්තමේන්තු කිරීම ජූලි 1 වන දිනය පදනම් කොට සිදු කරන අතර මධ්‍ය වාර්ෂික ජනගහනය ලෙස නම් කෙරේ. මෙම ගණනය කිරීම පෙර වර්ෂයේ ජූලි 1 දින සිට අදාල වර්ෂයේ ජුනි 30 වන දින දක්වා ලියා පදිංචි කල උපත් හා මරණ වල වෙනස(ස්වභාවික වර්ධනය = උපත් සංඛ්‍යාව - මරණ සංඛ්‍යාව) හා ශුද්ධ සංක්‍රමණය (ශුද්ධ සංක්‍රමණය = රට තුලට පැමිණි සංඛ්‍යාව - රටින් පිටවූ සංඛ්‍යාව) එකතුව පෙර වර්ෂයේ මධ්‍ය වාර්ෂික ජනගහනයට එකතු කිරීමෙන් ලබාගත හැක.

**අදාල වර්ෂයේ මධ්‍ය වාර්ෂික ජනගහනය =** **පසුගිය වර්ෂයේ මධ්‍ය වාර්ෂික ජනගහනය**

**+**

**උපත් සංඛ්‍යාව**

**–**

**මරණ සංඛ්‍යාව**

**+**

**රට තුලට පැමිණි සංඛ්‍යාව**

**–**

**රටින් පිටවූ සංඛ්‍යාව**

**වගුව 1:වාර්ෂිකව උපත්, මරණ, ශුද්ධ සංක්‍රමණය සහ ජනගහනය වෙනස්වීම-2013 -2023**

| කාල සීමාව | වර්ෂය | උපත් | මරණ | ශුද්ධ සංක්‍රමණය | ජනගහන වෙනස්වීම | මධ්‍ය වාර්ෂික ජනගහනය ('000) |
|---|---|---|---|---|---|---|
| 2012 ජූලි සිට 2013 ජූනි දක්වා | 2013 | 352,450 | 125,626 | -71,730 | 155,094 | 20,585 |
| 2013 ජූලි සිට 2014 ජූනි දක්වා | 2014 | 361,800 | 125,334 | -44,714 | 191,752 | 20,778 |
| 2014 ජූලි සිට 2015 ජූනි දක්වා | 2015 | 342,108 | 129,577 | -17,055 | 195,476 | 20,970 |
| 2015 ජූලි සිට 2016 ජූනි දක්වා | 2016 | 331,525 | 129,936 | 34,995 | 236,584 | 21,209 |
| 2016 ජූලි සිට 2017 ජූනි දක්වා | 2017* | 322,089 | 137,432 | 57,028 | 241,685 | 21,444 |
| 2017 ජූලි සිට 2018 ජූනි දක්වා | 2018* | 325,741 | 136,403 | 32,826 | 222,164 | 21,670 |
| 2018 ජූලි සිට 2019 ජූනි දක්වා | 2019* | 329,177 | 141,104 | -54,681 | 133,392 | 21,803 |
| 2019 ජූලි සිට 2020 ජූනි දක්වා | 2020* | 299,875 | 139,203 | -44,160 | 116,512 | 21,919 |
| 2020 ජූලි සිට 2021 ජූනි දක්වා | 2021* | 295,418 | 136,685 | 77,600 | 236,333 | 22,156 |
| 2021 ජූලි සිට 2022 ජූනි දක්වා | 2022* | 289,863 | 179,052 | -85,572 | 25,239 | 22,181 |
| 2022 ජූලි සිට 2023 ජූනි දක්වා | 2023* | 268,920 | 190,600 | -222,715 | -144,395 | 22,037 |

*යාවකාලිකයි

මූලාශ්‍රය: රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

වගුව 1 අනුව, 2012 ජූලි සිට 2013 ජූනි දක්වා කාලය තල උපත් 352,450 ක් ලියාපදිංචි කර ඇති අතර එම ප්‍රමාණය 2013 ජූලි සිට 2014 ජූනි කාල සීමාව තුල 361,800 දක්වා වැඩිවී ඇත. ඉන් පසු සෑම වසරකම ලියාපදිංචි උපත් ප්‍රමාණය ක්‍රමිකව අඩුවීමක් දක්නට ඇති අතර එය 2022 ජූලි සිට 2023 ජූනි කාලසීමාව තුල ලියාපදිංචි උපත් ප්‍රමාණය 268,920 දක්වා අඩුවී ඇත.

තවද, 2012 ජූලි සිට 2013 ජූනි දක්වා ලියාපදිංචි මරණ සංඛ්‍යාව 125,626 වූ අතර 2022 ජූලි සිට 2023 ජූනි කාලසීමාව වන විට එය 190,600 දක්වා ක්‍රමික වර්ධනයක් සිදුවී ඇත.

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ දත්ත වලට අනුව 2015 ජූලි සිට 2018 ජූනි හා 2020 ජූලි සිට 2021 ජූනි කාලසීමාව තුල රටින් පිටට ගිය ප්‍රමාණයට වඩා රට තුලට පැමිණීම ප්‍රමාණයට වැඩිවී ඇති අතර (ධන ශුද්ධ සංක්‍රමණයක් ) අනෙකුත් කාල සීමාවන් තුල රටින් පිටට ගිය ප්‍රමාණය රට තුලට පැමිණි ප්‍රමාණයට වඩා වැඩිවේ. ( ඍණ ශුද්ධ සංක්‍රමණයකි).

2021 ජූලි සිට 2022 ජූනි කාල සීමාව තුල **ශුද්ධ සංක්‍රමණය ඍණ** 85,572 වන අතර එය 2022 ජූලි සිට 2023 ජූනි කාල සීමාව තුල ඍණ 222,715 කි.

මේ අනුව උපත් වල ක්‍රමික අඩු විම හා මරණ වල ක්‍රමික වැඩි වීමත් රටින් පිටව ගිය ජනගහනයේ ක්ෂණික වැඩිවීමත් යන සමස්ථය සැලකීමෙන් 2022 වසරට වඩා 2023 වර්ෂයේ මධ්‍ය වාර්ෂික ජනගහනය 144,395 කින් අඩුවී ඇත.



වාර්ෂිකව උපත්, මරණ, ශුද්ධ සංක්‍රමණය සහ ජනගහනය වෙනස්වීම
2013 -2023
400,000
300,000
200,000
100,000
0
-100,000
-200,000
-300,000
2013 2014 2015 2016 2017 2018 2019 2020 2021 2022 2023
වර්ෂය
උපත්
මරණ
ශුද්ධ සංක්‍රමණය
ජනගහන වෙනස